# ශ්‍රී ලංකා ජාතික ගිණුම් ඇස්තමේන්තු

# දෙවන කාර්තුව 2018

**(නිෂ්පාදන ප්‍රවේශය - 2010 පාද වර්ෂය)**

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකාව**

## 1. 2018 දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2018 දෙවන කාර්තුව (අප්‍රේල්, මැයි, ජූනි) සඳහා දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක නිෂ්පාදන ප්‍රවේශය අනුව පවතින මිල ගණන් යටතේ සහ ස්ථාවර මිල ගණන් (2010) යටතේ ඇස්තමේන්තු කර නිකුත් කොට ඇත. 2018 වර්ෂයේ දෙවන කාර්තුව සඳහා ඇස්තමේන්තු කර ඇති ආර්ථික වර්ධන වේගය සියයට 3.7ක් බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව නිකුත් කරන ලද නිල නිවේදනය මඟින් දන්වා සිටියි. මෙම වසරේ දෙවන කාර්තුව සඳහා (2010) ස්ථාවර මිල ගණන් යටතේ ඇස්තමේන්තු කරනු ලැබූ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 2,264,445ක් වූ අතර පසුගිය වසරේ දෙවන කාර්තුවේ දී මෙම අගය රුපියල් මිලියන 2,183,122ක් විය.

2018 දෙවන කාර්තුවේ පවත්නා මිල ගණන් යටතේ ඇස්තමේන්තු කරන ලද දළ දේශීය නිෂ්පාදිතය සඳහා කෘෂිකාර්මික අංශයේ දායකත්වය සියයට 8.4ක් ද කර්මාන්ත අංශයේ දායකත්වය සියයට 25.6ක් ද සේවා අංශයේ දායකත්වය සියයට 57.1ක් ද වූ අතර භාණ්ඩ මත අය කෙරෙන ශුද්ධ බදු ලබා දෙන දායකත්වය සියයට 8.9ක් විය.

2018 දෙවන කාර්තුව සඳහා, කෘෂිකාර්මික සහ සේවා ආර්ථික කටයුතු පසුගිය වසරට සාපේක්ෂව පිළිවෙලින් සියයට 4.5ක සහ සියයට 4.8ක් වශයෙන් වර්ධනයන් වාර්තා කර ඇත. එමෙන්ම කර්මාන්ත ආර්ථික කටයුත්ත ද සියයට 2.3ක වර්ධනයක් වාර්තා කර ඇති අතර, සමස්ථ ආර්ථික වර්ධන වේගය මේ අනුව සියයට 3.7ක් ලෙස වාර්තාවේ.

සෑම ආර්ථික කටයුත්තකම එකතුකළ අගය ගණනය කෙරෙන්නේ දළ නිමවුමේ වටිනාකමින් එම නිමැවුම ජනනය කිරීම සඳහා යොදාගත් අතරමැදි යෙදවුම් වල වටිනාකම අඩු කිරීමෙනි. මෙහිදී අතරමැදි යෙදවුම් ගැනුම්කරුවාගේ මිලට ඇස්තමේන්තු කෙරෙන අතර දළ නිමැවුම ඇස්තමේන්තු කෙරෙන්නේ මූලික මිලටය. ඒ අනුව මෙහිදී දළ එකතුකළ අගය ගණනය වන්නේ මූලික මිලට වේ. මෙසේ මූලික මිල යටතේ ගණනය කර ඇති සමස්ත ආර්ථිකයේ දළ එකතුකළ අගයට භාණ්ඩ මත අය කෙරෙන බදු එකතුකොට භාණ්ඩ මත ලබාදෙන සහනාධාර අඩු කිරීම මගින් වෙළෙඳපොළ මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය ගණනය කෙරේ.

2018 දෙවන කාර්තුවේ දී ස්ථාවර මිල ගණන් යටතේ ඇස්තමේන්තු කරන ලද දළ දේශීය නිෂ්පාදිතය සඳහා භාණ්ඩ මත අය කෙරෙන ශුද්ධ බදු ලබා දෙන දායකත්වය සියයට 7.5කි. 2017 දෙවන කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුව තුල මෙහි සියයට 0.6ක සෘණ වර්ධනයක් වාර්තා වේ.

### 1.1 2018 දෙවන කාර්තුවේ දී කෘෂි ආර්ථික ක්‍රියාකාරකම් හී වර්ධන අනුපාතිකයන්

2018 දෙවන කාර්තුවේ දී කෘෂිකාර්මික අංශයෙහි සිදුවී ඇති සමස්ථ වර්ධනය සියයට 4.5කි. මෙම කාර්තුව තුළ කෘෂිකාර්මික ක්‍රියාකාරකම් වැඩි ප්‍රමාණයක් වර්ධනයන් වාර්තා කර ඇත.(රූප සටහන 1) එහිදී ප්‍රධාන කෘෂි ක්‍රියාකාරකම් ලෙස ගැනෙන “ වී වගා කිරීම”, “මිරිදිය ධීවර කටයුතු”, “අනෙකුත්

ධාන්‍ය වගා කිරීම", , "එළවලු වගා කිරීම" පිළිවෙලින් සියයට 59.3ක්, සියයට 32.8ක්, සියයට 19.2ක් සහ සියයට 9.6ක් වශයෙන් ඉහළ වර්ධනයන් වාර්තා කර ඇත. එසේම "පලතුරු වගාව", "බීජ සහ පැල නිෂ්පාදනය", "පොල් ඇතුළත් තෙල් සහිත පළතුරු බෝග වගාව" සහ "පානීය භෝග වගාව" වාර්තා කර ඇති වර්ධනයන් පිළිවෙලින් සියයට 6.9ක් ,සියයට 5.7ක්, සියයට 5.4ක් සහ සියයට 5.2ක් වේ. කෙසේ වෙතත් "කෙටිකාලීන භෝග වගාව", "රබර් වගා කිරීම", "තේ වගා කිරීම" සහ "දිගු කාලීන භෝග වගාව" පිළිවෙලින් සියයට 19.0ක්, සියයට 11.9ක්, සියයට 7.1ක් සහ සියයට 2.5ක් වශයෙන් ඍණ වර්ධනයන් වාර්තා කර ඇත.

**රූපසටහන 1: 2018 දෙවන කාර්තුවේ දී කෘෂි ආර්ථික ක්‍රියාකාරකම් හී වර්ධන අනුපාතිකයන්**




## 1.2 2018 දෙවන කාර්තුවේ දී කර්මාන්ත ක්‍රියාකාරකම් හී වර්ධන අනුපාතිකයන්

ප්‍රධාන කර්මාන්ත කටයුතු ද වැඩි ප්‍රමාණයක් 2018 දෙවන කාර්තුවේ දී වර්ධනයන් වාර්තාකර ඇත. මෙම කාර්තුවේ දී කාර්මික අංශයෙහි සිදුවී ඇති සමස්ථ වර්ධනය සියයට 2.3කි. (රූපසටහන 2)එහිදී 2017 දෙවන කාර්තුවේ දී සියයට 14.4ක පසුබෑමකට ලක්ව තිබූ "ගල් අගුරු,ඛනිජ තෙල් පිරිපහදු කිරීම" මෙම කාර්තුවේ දී සියයට 22.4ක වර්ධනයක් වාර්තා කර ඇත. "මූලික ලෝහ හා ව්‍යුවහාත්මක ලෝහ නිෂ්පාදනය", "ගෘහ භාණ්ඩ නිෂ්පාදනය",සහ "ආහාර පාන හා දුම්කොළ නිෂ්පාදනය" යන ප්‍රධාන අංශ පිළිවෙලින් සියයට 6.3ක්, සියයට 5.9ක් සහ සියයට 5.2ක් වශයෙන් සැලකිය යුතු වර්ධනයන් වාර්තා කර ඇත. නිෂ්පාදන කර්මාන්ත අතරින් දළ දේශීය නිෂ්පාදිතය සඳහා වැඩිම දායකත්වයක් ලබා දෙන "ආහාර පාන හා දුම්කොළ නිෂ්පාදනය" වාර්තා කර ඇති වර්ධනය සියයට 5.2කි. නිමැවුම් කර්මාන්ත අතුරෙන් "විදුලි ජනනය හා බෙදා හැරීම", "අපවහන පද්ධති සහ අපද්‍රව්‍ය කළමනාකරණය", "අනෙකුත් නිෂ්පාදන කර්මාන්ත" සහ "ජලය රැස් කිරීම, ප්‍රතිකාරක යෙදීම හා සැපයීම" පිළිවෙලින් සියයට 3.6ක්, සියයට 3.0ක්, සියයට 2.5ක් සහ සියයට 2.3ක් වශයෙන්

වර්ධනයන් වාර්තා කර ඇත. කාර්මික අංශය සඳහා වැඩිම දායකත්වයක් ලබා දෙන "ඉදිකිරීම් කර්මාන්ත" මෙම කාර්තුව තුල වාර්තා කර ඇති වර්ධනය සියයට 1.4කි. එසේ වුවද "කඩදාසි නිෂ්පාදනය", "රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදනය", "පතල් හා කැණීම් කර්මාන්ත" සහ "දැව සහ දැව නිෂ්පාදන" පිළිවෙලින් සියයට 3.8ක්, සියයට 2.7ක්, සියයට 1.0ක් සහ සියයට 0.9ක් වශයෙන් සෘණ වර්ධනයන් වාර්තා කර ඇත.

**රූපසටහන 2 : 2018 දෙවන කාර්තුවේ දී කර්මාන්ත ක්‍රියාකාරකම් හී වර්ධන අනුපාතිකයන්**




## 1.3 2018 දෙවන කාර්තුවේ දී සේවා ක්‍රියාකාරකම් හී වර්ධන අනුපාතිකයන්

2018 දෙවන කාර්තුවේ දී සේවා අංශයෙහි සිදුවී ඇති වර්ධනය සියයට 4.8කි. සේවා ක්‍රියාකාරකම් දෙකක් හැරුණු විට අනෙක් සියල්ලම මෙම කාර්තුවේ දී වර්ධනයන් වාර්තා කර ඇත. (රූපසටහන 3)එහිදී "විදුලි සංදේශන සේවා", "මූල්‍ය සේවා කටයුතු", "රක්ෂණ කටයුතු", " පරිගණක වැඩසටහන් නිෂ්පාදනය", "ආහාර පාන හා නවාතැන් සැපයීම", "තොග හා සිල්ලර වෙළදාම" සහ "අනෙකුත් පුද්ගල සේවා" පිළිවෙලින් සියයට 14.4ක්, සියයට12.0ක්, සියයට 11.0ක්, සියයට 9.0ක්, සියයට 6.4ක්, සියයට 4.9ක් සහ සියයට 4.8ක් වශයෙන් සැලකිය යුතු වර්ධනයන් වාර්තා කර ඇත. ඊට අමතරව සේවා ක්‍රියාකාරකම් අතරින් ඉහළ දායකත්වයක් ලබා දෙන ප්‍රවාහන සේවා කටයුතු සියයට 2.2ක වර්ධනයක් වාර්තා කර ඇත. කෙසේ වෙතත් "ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු" සහ "රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂක සේවා" පිළිවෙලින් සියයට 15.5ක් සහ සියයට 0.9ක් වශයෙන් සෘණ වර්ධනයන් වාර්තා කර ඇත.

**රූපසටහන 3 : 2018 දෙවන කාර්තුවේ දී සේවා ක්‍රියාකාරකම් හී වර්ධන අනුපාතිකයන්**




කිසියම් වර්ෂයක ස්ථාවර මිල ගණන් යටතේ ගණනය කෙරෙන දළ දේශීය නිෂ්පාදිතය හා පවත්නා මිල ගණන් යටතේ ගණනය කෙරෙන දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල අවධමනකය වේ. එහි අගය 2018 දෙවන කාර්තුවේ දී 149.24ක් වූ අතර 2017 දෙවන කාර්තුවේ දී එහි අගය 144.48කි. ඒ අනුව 2017 දෙවන කාර්තුවේ සිට 2018 දෙවන කාර්තුව තෙක් මිල මට්ටමේ සිදුවී ඇති ඉහළ යෑම සියයට 3.3කි.

නව කොළඹ පාරිභෝගික මිල දර්ශකය(CCPI) (2013=100) 2018 දෙවන කාර්තුවේ දී 208.5ක් ලෙස වාර්තා වී ඇති අතර එය 2017 දෙවන කාර්තුවේ දී 200.4ක් ලෙස වාර්තා විය. ඒ අනුව 2017 දෙවන කාර්තුවට සාපේක්ෂව 2018 දෙවන කාර්තුවේ මිල මට්ටමේ සිදුවී ඇති ඉහළ යෑම සියයට 4.0කි.

### 1.4 කෘෂිකාර්මික ක්‍රියාකාරකම්

**දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 8.4ක දායකත්වයක් සහිත කෘෂිකර්මාන්ත ක්‍රියාකාරකම් 2018 දෙවන කාර්තුවේ දී සියයට 4.5ක වර්ධනයක් වාර්තා කර ඇත.**

2016 සහ 2017 වසර වල දෙවන කාර්තු තුල පසුබෑමට ලක්ව තිබූ "ධාන්‍ය වගා කිරීම" ආර්ථික කටයුත්ත 2018 දෙවන කාර්තුවේ දී සියයට 19.2ක වර්ධනයක් වාර්තා කර ඇත. මෙම කාර්තුව තුල පැවති යහපත් කාලගුණික තත්වය බඩඉරිඟු වගාව සඳහා වඩාත් හිතකර වීම හේතුවෙන්, ධාන්‍ය වගා කිරීම යටතේ වැඩිම දායකත්වයක් ලබා දෙන බඩඉරිඟු අස්වැන්න සියයට 31කින් ඉහළ යාම මීට හේතු වී තිබේ.

“වී වගාකිරීම” ආර්ථික කටයුත්තේ එකතුකළ අගය 2018 දෙවැනි කාර්තුවේදී සියයට 59.3ක වර්ධනයක් වාර්තා කළ අතර 2017 දෙවැනි කාර්තුවේ දී සියයට 40.5ක පසුබැස්මක් වාර්තා කර ඇත. 2018 යල කන්නයේ වාර්තාගත වී නිෂ්පාදනය බුසල් මිලියන 69.2කි. වගාකරන ලද බිම් ප්‍රමාණය හා අස්වැන්න නෙලාගන්නා ලද බිම් ප්‍රමාණය පිලිවෙලින් සියයට 54.2කින් හා 55.3කින් මෙම කන්නය තුලදී වර්ධනය වී ඇත.

“එළවලු වගා කිරීම” ආර්ථික කටයුත්ත සඳහා මූර්ත එකතු කල අගය, 2018 දෙවැනි කාර්තුවේදී සියයට 9.6 ක වර්ධනයක් වාර්තා කර ඇත. එළවලු අස්වැන්න ප්‍රමාණාත්මකව වැඩි වීම හේතුවෙන් නිෂ්පාදකයාගේ මිල ගණන් අධික ලෙස පහළ යාම නිසා පවත්නා මිල ගණන් යටතේ එකතු කල අගයේ පසුබෑමක් වාර්තා වේ.

2017 දෙවන කාර්තුවේ දී “පළතුරු වගා කිරීමේ” ආර්ථික කටයුත්ත සියයට 5.4ක වර්ධනයක් වාර්තා කර තිබූ අතර එය තව දුරටත් මෙම කාර්තුව තුල සියයට 6.9ක වර්ධනයක් පෙන්නුම් කරයි.

“තෙල් සහිත පලතුරු වගාව” යන ආර්ථික ක්‍රියාකාරකම ප්‍රධාන වශයෙන් පොල් වගාව හා තැඹිලි වගාව යන ආර්ථික ක්‍රියාකාරකම් වලින් සමන්විත වන අතර පොල් වගා කිරීම ඉන් ප්‍රධාන වේ. 2017 සැප්තැම්බර් සිට 2018 මැයි මාසය දක්වා පැවති යහපත් කාලගුණික තත්වය හේතුවෙන් පසුගිය කාර්තු 5ක් පුරා පැවතුණු පොල් නිෂ්පාදනයේ පසුබෑම නවතාලමින් 2017 දෙවන කාර්තුවට සාපේක්ෂව 2018 වර්ෂයේ දෙවන කාර්තුවේදී පොල් නිෂ්පාදනය සියයට 5.4කින් ඉහල ගොස් ඇත. එනම් පොල් ගෙඩි නිෂ්පාදනය මිලියන 32කින් වැඩි වී ඇත. 2017 දෙවන කාර්තුවට සාපේක්ෂව පොල් ගෙඩියක නිෂ්පාදකයාගේ මිල රු. 46 සිට රු. 55 දක්වා වැඩි වී ඇති අතර මෙම කාර්තුව තුලදී ද පොල් ගෙඩි වශයෙන් අපනයනය සිදු කර නොමැත. “තෙල් සහිත පලතුරු වගාව” යන උප ආර්ථික ක්‍රියාකාරකම මෙම කාර්තුව තුල දී ස්ථාවර මිල ගණන්(2010 ) යටතේ රුපියල් මිලියන 14,084ක් දළ දේශීය නිෂ්පාදනයට ලබා දෙමින් සියයට 1.0ක දායකත්වයක් වාර්තා කර ඇත.

“තේ වගා කිරීම” ආර්ථික කටයුත්ත 2018 දෙවැනි කාර්තුවේදී සියයට 7.1ක පසුබැස්මක් වාර්තා කර ඇති අතර 2017 දෙවැනි කාර්තුවේදී එය සියයට 6.8ක වර්ධනයක් වාර්තා කර ඇත. 2017 දෙවැනි කාර්තුව හා සැසඳීමේදී මෙම කාර්තුවේදී තේ නිෂ්පාදන ප්‍රමාණයෙහි සියයට 6.8ක පසුබැස්මක් වාර්තාවී ඇත. තේ වගා කරන ප්‍රදේශවල පැවති අයහපත් කාලගුණික තත්වය තේ නිෂ්පාදන ප්‍රමාණයෙහි පහල යාමට මූලික වශයෙන් බලපා ඇත. 2018 දෙවැනි කාර්තුවෙහි තේ අපනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 68,701ක් වන අතර පසුගිය වසරේ මෙම කාර්තුව හා සැසඳීමේදී එය සියයට 2.2ක පසුබැස්මක් වාර්තා කරයි. කොළඹ වෙළඳපලේ තේ කිලෝවක සාමාන්‍ය මිළ 2018 දෙවැනි කාර්තුවේදී රු. 576.24ක් වන අතර 2017 දෙවැනි කාර්තුවේදී එම අගය රු. 621.46කි. තේ වෙළඳපොලේ සියයට 60.2ක වැඩිම දායකත්වයක් ලබා දෙන පහතරට තේ නිෂ්පාදනය සියයට 7.5ක පසුබැස්මක් මෙම කාර්තුවේදී වාර්තා කර ඇත.

“රබර් වගාව” ආර්ථික කටයුත්තේ එකතුකළ අගය 2018 දෙවැනි කාර්තුවේදී සියයට 11.9ක පසුබෑමක් වාර්තා කර ඇති අතර 2017 දෙවැනි කාර්තුවේදී සියයට 10.2ක වර්ධනයක් වාර්තා කර ඇත. 2018 දෙවැනි කාර්තුවේදී ලෝක වෙළඳපොලේ රබර් කිලෝ ග්‍රැමයක මිල රු.354.46 සිට රු. 336.43 දක්වා සියයට 5.09කින් පසුබැස්මක් වාර්තා වේ.

“වෙනත් ස්ථිර බෝග වගාකිරීම” ආර්ථික කටයුත්ත රා මැදීම, බුලත් වගාකිරීම, පුවක් වගාකිරීම, කොට්ටකිලන්ගු, කොස් හා දෙල් වගාකිරීම යන උප අංශයන්ගෙන් සමන්විත වේ. සමස්තයක් ලෙස මෙම ක්‍රියාකාරකම මගින් ස්ථාවරමිල ගණන්(2010 ) යටතේ 2018 දෙවන කාර්තුව සඳහා මුළු දළ දේශීය නිෂ්පාදිතය වෙත එකතු කල අගය රුපියල් මිලියන 4,257ක් වේ. 2017 දෙවන කාර්තුවට සාපේක්ෂව මෙම ආර්ථික ක්‍රියාකාරකම සියයට 2.5ක පසුබෑමක් වාර්තා කර ඇත. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ පොල් රා නිෂ්පාදනය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වීමය.

“සත්ව නිෂ්පාදන” ආර්ථික ක්‍රියාකාරකම මස් පිණිස සතුන් ඇතිකිරීම, කිරි නිෂ්පාදනය සහ බිත්තර නිෂ්පාදනය යන උප අංශයන්ගෙන් සමන්විත වේ. සමස්තයක් ලෙස මෙම ක්‍රියාකාරකම මගින් ස්ථාවරමිල ගණන්(2010 ) යටතේ 2018 දෙවන කාර්තුව සඳහා මුළු දළ දේශීය නිෂ්පාදිතය වෙත එකතු කල අගය රුපියල් මිලියන 14,371ක් වන අතර මුළු දළ ජාතික නිෂ්පාදිතයට ලබා දෙන දායකත්වය සියයට 0.8කි. 2017 දෙවන කාර්තුවට සාපේක්ෂව මෙම ආර්ථික ක්‍රියාකාරකම සියයට 2.6ක වර්ධනයක් වාර්තා කර ඇත. සත්ත්ව නිෂ්පාදනය යන ආර්ථික ක්‍රියාකාරකම තුළ සියයට 50ක පමණ දායකත්වයක් දක්වන මස් පිණිස කුකුළන් ඇති කිරීම, මෙම කාර්තුව තුළදී සියයට 2.5ක ඉහල යාමක් වාර්තා කර ඇත. මෙම කාර්තුව තුළදී කිරි නිෂ්පාදනය හා බිත්තර නිෂ්පාදනය 0.6ක හා 0.5ක වර්ධනයක් ලබා ඇත. “සත්ව නිෂ්පාදන” ක්‍රියාකාරකම යටතේ ඇති බිත්තර සඳහා නිෂ්පාදකයාගේ මිල 2017 දෙවන කාර්තුව හා සමව පවතින අතර අනෙකුත් ක්‍රියාකාරකම් හි නිෂ්පාදකයාගේ මිල ගණන් 2017 දෙවන කාර්තුවට සාපේක්ෂව වර්ධනය වී ඇත.

“වන වගාව සහ දැව කඳන් නිෂ්පාදනය” ආර්ථික ක්‍රියාකාරකම 2018 දෙවන කාර්තුවේ දී සියයට 0.3ක සුළු පසුබෑමක් වාර්තා කරයි. මෙම ක්‍රියාකාරකම මගින් දළ දේශීය නිෂ්පාදනය වෙත එකතු කල අගයේ දායකත්වය (2010 ස්ථාවර මිළ අනුව) රුපියල් මිලියන 15,759 ක් වන අතර එය සමස්ත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 0.7කි.

2017 දෙවන කාර්තුව හා සැසඳීමේ දී 2018 දෙවන කාර්තුව තුල “කරදිය මත්ස්‍ය නිෂ්පාදනය හා ජලජීවී” ආර්ථික කටයුත්ත සියයට 0.5ක පසුබෑමකට ලක් වී ඇත. පසුගිය අප්‍රියෙල් සහ මැයි මාසවල පැවති අධික වැසි සහ අයහපත් කාලගුණික තත්වයන් හේතුවෙන් ද දිවයින වටා මුහුදේ විටින් විට ඇතිවූ රළු ස්වභාවය හේතුවෙන් අදාල කාලයන් තුල ධීවරයන් මුහුද යාමෙන් වැලකී සිටීම නිසා ද කරදිය මත්ස්‍ය නිෂ්පාදනය අඩු වී ඇත.

2017 දෙවන කාර්තුවේදී සියයට 9.0 ක වර්ධනයක් වාර්තා කර ඇති “මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය හා ජලජීවී” ආර්ථික කටයුත්ත තවදුරටත් මෙම කාර්තුව තුල සියයට 32.8ක වර්ධනයක් වාර්තා කර ඇත.

පොළොන්නරුව, අම්පාර, කළුතර, හම්බන්තොට, ගම්පහ, පුත්තලම සහ මාතලේ යන දිස්ත්‍රික්ක වලින් ඉහල මත්ස්‍ය අස්වැන්නක් වාර්තා වීම මේ සඳහා බලපා ඇත.

**1.5 කර්මාන්ත ක්‍රියාකාරකම්**

**දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 25.6ක දායකත්වයක් දක්වමින් දෙවන ස්ථානය ගන්නා කර්මාන්ත ක්‍රියාකාරකම්, 2018 දෙවන කාර්තුවේ දී වාර්තා කර ඇති වර්ධනය සියයට 2.3 කි.**

දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 2.5ක දායකත්වයක් දක්වන "පතල් හා කැණීම්" කර්මාන්තය 2018 වර්ෂයේ දෙවන කාර්තුවේදී සියයට 1.0ක පසුබැස්මක් වාර්තා කර ඇත. පතල් හා කැණීම් කර්මාන්තය ප්‍රධාන වශයෙන් ගල්,වැලි,පස් වැනි ඉදිකිරීම් ද්‍රව්‍ය කැණීම, මැණික් කැණීම සහ වෙනත් ඛනිජ වර්ග කැණීම වශයෙන් උප කාණ්ඩ තුනක් යටතේ වර්ග කර ඇති අතර මේ අතරින් ඉදිකිරීම් ද්‍රව්‍ය කැණීම සමස්ථ ආර්ථික කටයුත්තේ එකතුකළ අගය සඳහා වැඩිම දායකත්වයක් සපයයි. මේ යටතේ කොළඹ මූල්‍ය නගරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ සිදු කෙරෙන මුහුදු වැලි කැණීම ද ආවරණය කර ඇත. මැණික් අපනයනයේ දී 2017 දෙවන කාර්තුවට සාපේක්ෂව 2018 දෙවන කාර්තුවේ දී සිදු වී ඇති පසුබෑම විශේෂයෙන් පතල් හා කැණීම් කර්මාන්තයේ සමස්ථ පසුබෑමට බලපා ඇත.

**නිෂ්පාදන කර්මාන්ත අංශයට අයත් ආර්ථික කටයුතු වැඩි ප්‍රමාණයක් 2018 දෙවැනි කාර්තුවේදී වර්ධනයන් වාර්තාකර ඇත.**

නිෂ්පාදන කර්මාන්ත අංශයට වැඩිම දායකත්වයක් සපයන "ආහාර පාන හා දුම්කොළ නිෂ්පාදන" කර්මාන්තය 2017 වර්ෂයේ දෙවැනි කාර්තුවට සාපේක්ෂව 2018 වර්ෂයේ දෙවැනි කාර්තුවේ සියයට 5.2ක වර්ධනයක් වාර්තාකර ඇත. ඒ සඳහා ආහාර නිෂ්පාදන කර්මාන්තයේ නිමවුම් වටිනාකම සියයට 7.5කින්, බීම නිෂ්පාදන කර්මාන්තයේ නිමවුම් වටිනාකම සියයට 9.4කින් හා දුම්කොළ නිෂ්පාදන කර්මාන්තයේ නිමවුම් වටිනාකම සියයට 6.9කින් ඉහළයාම හේතු වී ඇත.

එමෙන්ම "රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදන" කර්මාන්තය සියයට 1.9ක වර්ධනයක් මෙම කාර්තුවේදී වාර්තා කරයි. එම නිෂ්පාදනයේ නිමවුම් වටිනාකම සියයට 9.5කින් ඉහළ යාම මේ සඳහා බලපා ඇත.

2018 දෙවැනි කාර්තුවේදී "දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන" කර්මාන්තය සියයට 0.9ක පසුබෑමක් පෙන්නුම් කරයි.

"ගල් අඟුරු, ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන" කර්මාන්තය මෙම කාර්තුවේදී සියයට 22.4ක ඉහල වර්ධනයක් වාර්තා කර ඇත. පෙට්‍රෝලියම් නිෂ්පාදන ප්‍රමාණය සියයට 31.4කින් ඉහළ යාම මීට ප්‍රධාන හේතුව වේ.

"මූලික ලෝහ හා ව්‍යුහාත්මක ලෝහ නිෂ්පාදන" කර්මාන්තයේ දී 2017 දෙවැනි කාර්තුවේදී සියයට 6.9ක වර්ධනයක් වාර්තාකර තිබූ අතර එම කර්මාන්තය තව දුරටත් 2018 දෙවැනි කාර්තුවේදී සියයට

6.3ක වර්ධනයක් වාර්තා කර ඇත. එම නිෂ්පාදනයේ නිමවුම් වටිනාකම සියයට 12.0කින් ඉහළ යාම මේ සඳහා බලපා ඇත.

2018 දෙවැනි කාර්තුවේදී "යන්ත්‍ර සූත්‍ර උපකරණ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන" කර්මාන්තය සියයට 1.2ක වර්ධනයක් පෙන්නුම් කරන අතර එම අංශයට අදාල විදුලි උපකරණ නිෂ්පාදනය සියයට 7.1කින් සහ මෝටර් රථ වාහන හා ට්‍රේලර් නිෂ්පාදනය සහ අනෙකුත් ප්‍රවාහන උපකරණ නිෂ්පාදනය යන උප අංශ දෙක සියයට 8.8කින් වැඩි වීම මේ සඳහා බලපා ඇති බව පෙන්වා දිය හැක.

"ගෘහභාණ්ඩ නිෂ්පාදන" කර්මාන්තය 2018 දෙවන කාර්තුවේදී සියයට 5.9ක වර්ධනයක් වාර්තා කරන අතර එහි නිමැවුම් වටිනාකම සියයට 6.3කින් ඉහල ගොස් ඇත.

"විදුලිය නිෂ්පාදන" කර්මාන්තයෙහි මූර්ත එකතු කළඅගය 2018 දෙවන කාර්තුවේ දී සියයට 3.6කින් ඉහළ යාමක් වාර්තා වී ඇත. එය 2017 දෙවන කාර්තුවේ දී සියයට 3.3ක වර්ධනයක් වාර්තා කර තිබුණි. අදාළ කාලපරිච්ඡේදය තුළ මුළු විදුලිබල ජනනය ගිගාවොට් 3,620 සිට ගිගාවොට් 3,765 දක්වා සියයට 4කින් ඉහළ ගොස් ඇත. සමස්ත විදුලි බල ජනනයෙන් ජල විදුලිබල ජනනය සහ තාප විදුලිබල ජනනය අතර අනුපාතය 45:55 ලෙස වාර්තා විය. එම අනුපාතය 2017 දෙවන කාර්තුවේ දී 27:73 ලෙස වාර්තා වී තිබුණි. 2018 දෙවන කාර්තුවේ දී විදුලිබල විකුණුම් ආදායමේ සියයට 5.2ක ඉහළ යාමක් වාර්තා වී ඇත.

2018 දෙවන කාර්තුවේ දී "ජලය එක්රැස් කිරීම,පිරිසිදු කිරීම සහ බෙදාහැරීම" යන ආර්ථික කටයුත්ත සියයට 2.3ක වර්ධනයක් වාර්තා කර ඇත. සපයන ලද ජල ප්‍රමාණය, 2017 දෙවන කාර්තුවේ ඝන මීටර් මිලියන 171 සිට 2018 දෙවන කාර්තුවේ මිලියන 176 දක්වා, සියයට 3.0කින් ඉහළ ගොස් ඇත.එමෙන්ම මෙහි අලෙවි ආදායම සියයට 4.5කින් ඉහළ ගොස් ඇත.

2017 දෙවන කාර්තුව හා සංසන්දනයේදී 2018 දෙවන කාර්තුව සඳහා "ඉදිකිරීම් කර්මාන්තය" සියයට 1.4ක වර්ධනයක් වාර්තා කරන අතර දළ දේශීය නිෂ්පාදිතය සඳහා දායකත්වය සියයට 7.7කි. මෙම කාර්තුව තුලදී සමස්ත සිමෙන්ති නිෂ්පාදනය සියයට 2.15කින් ඉහළ ගොස් ඇත. මෙහිදී සිමෙන්ති ආනයනය සියයට 3.59කින් වැඩි වී ඇති අතර දේශීය නිෂ්පාදනය සියයට 0.91කින් පහල යාමක් වාර්තා කර ඇත.

### 1.6 සේවා ක්‍රියාකාරකම්

**දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 57.1ක ඉහළම දායකත්වයක් සහිත සේවා ක්‍රියාකාරකම්, 2018 දෙවන කාර්තුව සඳහා සියයට 4.8ක වර්ධනයක් වාර්තා කර ඇත.**

2018 දෙවන වන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 12.7ක දායකත්වයක් සපයන "තොග සහ සිල්ලර වෙළඳාම" මෙම කාර්තුවේ දී සියයට 4.9ක වර්ධනයක් වාර්තා කර ඇත. තොග සහ

සිල්ලර වෙළඳාම් කාර්යයෙහි එකතු කළ අගය කෙරෙහි මුළු ආනයන හා මුළු දේශීය නිෂ්පාදන වල වෙනස්වීම බලපානු ලැබේ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවුම් ශේෂ සංඛ්‍යාලේඛන වලට අනුව මුළු ආනයන වියදම 2017 දෙවන කාර්තුවේ වාර්තා වූ රුපියල් මිලියන 741,644ට සාපේක්ෂව මෙම කාර්තුවේ දී රුපියල් මිලියන 862,688 දක්වා සියයට 16.3කින් වැඩිවී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙළෙඳ දර්ශක වලට අනුව පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා දර්ශකය මෙම කාර්තුවේ දී සියයට 19.6කින් වැඩිවී ඇත. තව ද කර්මාන්ත ආර්ථික කටයුතුවල මුළු වෙළෙඳ තීරුවේ වටිනාකම රුපියල් මිලියන 215,457 සිට රුපියල් මිලියන 235,604 දක්වා සියයට 9.4කින් වැඩිවී ඇත.

“මගීන් සහ භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම” යන ආර්ථික ක්‍රියාකාරකම, භාණ්ඩ හා සේවා ගොඩබිම් ප්‍රවාහනය, මුහුදු මාර්ග වල ප්‍රවාහනය සහ ගුවන් සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම යන උප කාර්යයන් ගෙන් සමන්විත වේ. මෙම ක්‍රියාකාරකම 2017 දෙවන කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුවේ දී සියයට 2.3ක වර්ධනයක් වාර්තා කර ඇත. ගුවන් සේවා වාර්තා අනුව මෙම කාර්තුවේ ආදායම සියයට 21.7කින් ඉහළ ගොස් ඇත. 2018 දෙවන කාර්තුවේදී මුහුදු මාර්ග ප්‍රවාහන සේවාවන් හී ආදායම සියයට 75.9කින් වැඩි වී ඇත. ගොඩබිම ප්‍රවාහන සේවාවන්ගේ ස්ථාවර මිළ යටතේ එකතු කළ අගය සියයට 1.04ක වර්ධනයක්ද වාර්තා කර ඇත.

පසුගිය වසරේ දෙවන කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුවේ දිවයිනේ මුළු වාහන ලියාපදිංචි කිරීම සියයට 46.3 කින් ඉහළ ගොස් ඇති අතර මෙම කාර්තුවේදී මෝටර් රථ ලියාපදිංචිය සියයට 136.5කින් සහ බස් රථ, ලොරි රථ, ද්විත්ව කාර්ය වාහන, ත්‍රීරෝද රථ, ඉඩම් වාහන ලියාපදිංචිය පිළිවෙලින් සියයට 3.7ක් ,14.0ක්, 12.2ක්, 11.3ක් සහ 38.7ක් ලෙස පහළ ගොස් ඇත. දුම්රිය දෙපාර්තුමේන්තුවේ ආදායම සියයට 15.8ක ඉහළ යාමක් වාර්තා කරන අතර ධාවනය වූ දුම්රිය කිලෝමීටර් ගණන සියයට 2.1ක අඩුවීමක් වාර්තා කරයි. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයෙහි ආදායම සියයට 6.5කින් වැඩි වී ඇත. එම ප්‍රවාහන සේවාවෙහි මගී කිලෝමීටර් සංඛ්‍යාව සියයට 0.4ක පසුබැස්මක් වාර්තා කරයි. ශ්‍රී ලංකා ගුවන් සේවා ආදායම මෙම කාර්තුවේදී සියයට 21.7ක වර්ධනයක් පෙන්වන අතර එම ප්‍රවාහන සේවාවෙහි මගී කිලෝමීටර් සංඛ්‍යාව සියයට 22.2ක වැඩිවීමක්ද වාර්තා කර ඇත.

“තැපැල් හා කුරියර් සේවා” ආර්ථික කටයුත්ත සැලකීමේදී, 2017 පළමු වන කාර්තුවට සාපේක්ෂව 2018 දෙවන කාර්තුවෙහි වර්ධනය සියයට 4.7කි. තැපැල් දෙපාර්තමේන්තුවේ දත්ත වාර්තා අනුව, පසුගිය කාර්තුව හා සැසඳීමේදී මෙම කාර්තුව තුල සේවක වැටුප් හා වේතන වැඩි වීමක් දක්නට ඇති අතර ඊට සාපේක්ෂව අතිකාල දීමනා ගෙවීම් වල අඩු වීමක් පෙන්නුම් කරයි.

දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.6ක දායකත්වයක් දරන “නවාතැන්, ආහාර හා බීම වර්ග සැපයීම” යන ආර්ථික කටයුත්ත පෙර වර්ෂයේ දෙවන කාර්තුව හා සළකා බලන විට මෙම වර්ෂයේ

දෙවන කාර්තුවේ එකතුකළ අගය සියයට 6.4ක ඉහළ යාමක් වාර්තා කරයි. පසුගිය වර්ෂයේ දෙවන කාර්තුව හා සසඳන විට මෙම කාර්තුව තුළදී සංචාරක පැමිණීම සියයට 12.6කින් වැඩි වී ඇත.

"වැඩසටහන් සකස් කිරීම, විකාශන කාර්යයන්, ශබ්ද පටිගත කිරීම හා වීඩියෝ නිෂ්පාදනය කිරීම" යන සේවා ආර්ථික කාර්යය සියයට 15.5ක සෘණ වර්ධනයක් 2017 දෙවන කාර්තුවට සාපේක්ෂව 2018 දෙවන කාර්තුවේදී වාර්තා කර ඇත.

"සන්නිවේදන සේවාවන්" හී මූර්ත එකතු කළ අගය 2017 දෙවන කාර්තුවට සාපේක්ෂව, 2018 දෙවන කාර්තුව තුල තව දුරටත් සියයට 14.4කින් ඉහළ ගොස් ඇත. මෙම කාර්තුව තුල ජංගම දුරකථන සම්බන්ධතාවන්හි සියයට 18.0ක වර්ධනයක් වාර්තා වී ඇත.

"පරිගනක වැඩසටහන් සම්පාදනය පිළිබඳ උපදේශනය හා සම්බන්ධ කාර්යයන්" යන ආර්ථික ක්‍රියාකාරකම 2017 වර්ෂයේ දෙවන කාර්තුවට සාපේක්ෂව සියයට 9.0ක වර්ධනයක් වාර්තා කර ඇත.

'මුල්‍ය සේවා සැපයීම" ආර්ථික කටයුත්තේ 2018 දෙවන කාර්තුව සඳහා වර්ධනය සියයට 12.0ක් ලෙස වාර්තා වේ. පෙර වර්ෂයේ දෙවන කාර්තුවේ මෙහි වර්ධනය සියයට 10.6ක් ලෙස වාර්තා වී තිබුණි. 2018 දෙවන කාර්තුවේ දී බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා සේවක ගෙවීම් සියයට 16.37කින් වැඩි වී ඇත. එමෙන්ම මෙම ආයතන සඳහා බදු ගෙවීමට පෙර ලාභය සියයට 0.31කින් අඩු වී ඇත. මුල්‍ය සේවාවන්හි භාවිතාව, ණය සහ අත්තිකාරම් වටිනාකම සහ මුළු තැන්පතු වටිනාකම මගින් පෙන්නුම් කරයි. ඒ අනුව ණය අත්තිකාරම් වටිනාකම සහ මුළු තැන්පතු වටිනාකම 2018 දෙවන කාර්තුවේ දී පිළිවෙලින් සියයට 14.70කින් සහ 15.48කින් වර්ධනය වී ඇත. 2018 දෙවන කාර්තුවේ දී "හරිත සාමාන්‍ය ණය පොලී අනුපාතය " සහ "හරිත සාමාන්‍ය තැන්පතු පොලී අනුපාතය " පිළිවෙලින් සියයට 14.05 ක් සහ සියයට 8.92 ක් ලෙස සටහන් විය. 2017 දෙවන කාර්තුවේ දී ඒවා සියයට 13.73ක් සහ සියයට 9.13ක් ලෙස සටහන්ව ඇත.

"රක්ෂණ සේවා සැපයීම සහ විශ්‍රාම වැටුප් අරමුදල් කළමනාකරණය කිරීමේ" කටයුතු වල මූර්ත එකතු කල අගය 2018 දෙවැනි කාර්තුවේ දී සියයට 11.0 ක වර්ධනයක් වාර්තා කර ඇත. එය 2017 දෙවැනි කාර්තුවේ දී සියයට 3.6 ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. මෙම කාලයේදී රක්ෂණ සමාගම් වල සේවක ගෙවීම් සහ බදු පෙර ලාභයෙහි වර්ධනයක් වාර්තා වී ඇත. මෙම සේවාව කෙතරම් භාවිත වූයේ දැයි නිරූපනය කෙරෙන උපයන ලද රක්ෂණ වාරික වටිනාකම සහ උපයන ලද හිමිකම් වටිනාකම් හී එකතුව මෙම කාර්තුවේ දී සියයට 15.0 කින් වර්ධනය වී ඇත.

"දේපළ වෙළඳාම් කාර්යයන්, නිවාස අයිතිය ඇතුළත්ව" යන ආර්ථික කටයුත්ත 2017 දෙවන කාර්තුවට සාපේක්ෂව 2018 දෙවන කාර්තුවේ දී තව දුරටත් 3.7කින් වර්ධනය වී ඇත. මූර්ත මිල ගණන් යටතේ දළ ජාතික නිෂ්පාදිතයට එකතු කල අගය රුපියල් මිලියන 139,624ක් වන අතර පවත්නා මිල යටතේ සියයට 6.1ක දායකත්වයක් පෙන්නුම් කරයි.

“වෘත්තීය සේවා” 2017 දෙවන කාර්තුවට සාපේක්ෂව 2018 දෙවන කාර්තුවේ දී සියයට 2.2ක වර්ධනයක් වාර්තා කර තිබේ. මෙහි එකතුකළ අගය ගණනය කරනු ලබන්නේ ආර්ථික ක්‍රියාකාරකම් 8 ක එකතුවක් ලෙසිනි. මෙය ප්‍රධාන වශයෙන් “ නීති හා ගිණුම් කාර්යයන්”, “ගෘහනිර්මාන හා ඉංජිනේරු කාර්යයන්”, “ විද්‍යාත්මක පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන්” “ප්‍රචාරණ හා අලෙවි පර්යේෂණ, වෙනත් වෘත්තීය, විද්‍යාත්මක හා තාක්ෂණ කාර්යයන්” සහ “ප්‍රකාශන කාර්යයන්”, “පශු වෛද්‍ය කාර්යයන්”. “කුලී හා බදු කාර්යයන්”, “රැකියා, රැකියා නියෝජිත ආයතන, ආරක්ෂක හා විමර්ශණ කාර්යයන්” සහ “ගොඩනැගීම් හා උද්‍යාන සැකසීම සම්බන්ධ සේවා සැපයීම් කාර්යයන්” ගෙන් සමන්විත වේ.

“කලා හා පොදු විනෝදාත්මක කටයුතු සහ අනෙකුත් පෞද්ගලික කාර්යයන්“ යන ආර්ථික කටයුත්ත “වෙනත් පුද්ගල සේවා කාර්යයන්” යටතේ ම සදහන් කර ඇත. 2017 දෙවන කාර්තුවට සාපේක්ෂව ඉහත උප ආර්ථික කටයුත්තෙහි මූර්ත එකතු කළ අගය සියයට 4.8කින් වැඩිවී ඇත.


**ජාතික ගිණුම් අංශය - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**දු.ක. : 94 - 011- 2147071 ෆැක්ස්: 94 - 011- 2877938**

**ඊ මේල්: national.accounts@statistics.gov.lk**

**වෙබ් අඩවිය: www.statistics.gov.lk**